## මවුතුමියනි!

අනන්ත වූ නුබ ගැබේ පායා
සනඳුර දුරු කළා වූ
සරා සඳ නුඹමයි
රජරට සරු කරන
මහ වැව් ඉතිරවන
කලා වැව් දිය තොමෝ
නුඹමයි
මුළු ලොවක් බිහි කළ
කඳුළු වැල් නැතිකර
ලොව සදන මවුතුමිය
සැබැවට නුඹමයි!

♦ මධුෂා ලක්මාලි වන්නිනායක
කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය
කැකිරාව Sri Lanka

## Rabbit & the bit of beet

A rabbit bit
An itty bitty
Bit of beet
Until the rabbit cried.

This itty bitty
Bit of beet
Was too bitter
Until he bit another
Bit of beet.

It became
A pretty bitty
Bit of sweet.

Then the rabbit said
Bitter or sweet
An itty bitty
Bit of beet
Is better than none.

♦ **Ravindu Ranawaka**
*10 Years old*
***Sycamore Elementary***
**Simi Valley, CA, USA**




**Children's Corner**

## Why penguins have wings but can't fly ?

### *පෙන්ගුවින්ට පිහාටු ඇතත් පියාඹන්නට බැරි ඇයි?*



Penguins use their wings as flippers for swimming. Their ancestors could probably fly, but may have lost their ability while learning to dive and swim faster. The bones of the wing are flattened thin and streamlined, but strong enough to push the bird through the water. The feathers are short and leave no part unprotected from the cold.

**පෙ**න්ගුවින්ලා තම පියාපත් යොදාගන්නේ වරල් මෙන් ගසමින් වතුරේ පීනන්නටය. ඔවුන්ගේ ආදි පරපුරට පියෑඹීමේ හැකියාව තිබුණේ වී නමුදු වේගයෙන් පිහිනන්නටද, දිය යට කිමිදෙන්නටද පටන්ගත් දිනේ සිට පියෑඹීමේ හැකියාව ක්‍රමයෙන් ඔවුන් කෙරෙන් ඈත් වී ගිය බව පෙනෙන්නට තිබේ. පියාපත්වල ඇට පැතලිය, සිහින්ය. එහෙත් ශක්තිමත්ය. සුළඟ හෝ ජලය කපාගෙන ඉදිරියට යෑමට පුළුවන් වනසේ සැකසී ඇති එම කෙටි පියාපත් පෙන්ගුවින් කුරුල්ලාගේ සිරුර සීතලෙන් ආරක්ෂා කරයි.

♦ ***Auntie Ramani*** (*රමණී නැන්දා*)

### පිටිසර ගම



කෙත් යායෙන් වටවූ මේ ගම්මා නේ
මඳ සුළඟින් නිතරම සේදී යන් නේ
තරමක් පිටිසර වූවද ගම්මා නේ
සුන්දර බවින් නැත අඩුවක් දැනෙන් නේ

ගම කෙළවර ඇත්තේ මහ කන්දක් ය
ඉන් ඔබ්බට පිහිටියෙ මහ කැලයක් ය
තව කොනකින් ඇත්තේ දිය ඇල්ලක් ය
ඈතට පෙනේ කිරි දහරක් ලෙසට මෙ ය

කඩමණ්ඩිය පිහිටියේ ගම කෙළවර ය
මේ හැම දෙනා කවුරුත් හරිම සමගි ය
ගමේ සිටින මිනිසුන් හරි එඩිතර ය
මේ ගම දිනෙන් දින දිදුලන පහනක් ය

***දමිත් චතුරංග ගලගොඩ***
මහා බෝධි මහා විද්‍යාලය
අනුරාධපුර **Sri lanka**


ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

*ලන්ඩන් ශාඛාව*

*වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.*

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


## ❊ සුබ මංගලම්! ❊ Wedding Greetings! ❊



**ලංකාවිත්ති පුවත්පත අගය කරන තරුණ යුවලක් වන නුගේගොඩ බුද්ධි උපසේන සහ නිවර්තනා සුබසිංහ දෙදෙනාගේ විවාහය විශාල නෑදෑ හිතවතුන් පිරිසක් මධ්‍යයේ ගිය සතියේ කොළඹ ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයේ දී සිදුකෙරිණ. එහිදී ගත් මේ ඡායාරූපය ඊයේ අප වෙත එවා තිබුණි. මනාලයාගේ වැඩිමහල් සොයුරිය රසිකා සහ ඇගේ හිමි නිශාන්තද, ඔවුන්ගේ දියණිය අශේන්ද්‍රි ද මෙහි නව යුවළ දෙපසින් වෙති. නව යුවලට නව දිවියට ලංකාවිත්ති සුබ පැතුම් !** ***Photograph*** **- Niranjan**

## My Grandfather

My name is Lochana Ratnayake. I am from Kurunegala, Sri Lanka. My mother's name is Nilangi Kodituwakku and my father's name is Wimal Ratnayake. Now I would like to tell you about my grandfather.

I love my grandfather very much - more than my parents. **'Thaththa'** is the word in our Sinhala language, meaning, 'father'. So I call him as - Thaththa. His name is **Chandrawansa Kodituwakku** and I think he is about 60 or 65. But my grandfather does not look that old.

Sometimes he is like a funny baby and also he quickly gets angry sometimes. However I must tell you that he is a good dancer, a good singer and also a good father. All his family members call him " **kalu** ". It's the meaning of 'black' colour. But my grandfather is fair in colour. He has a funny look and a pleasant face.

I love my grandfather very much. But he is not with me. He is in England. I like to go near my grandfather. Then I would be happy. That's my wish.

Can any one please help me to fulfil my wish ?

♦ ***Lochana Ratnayake*** **(11yrs)**
**Maliyadeva Girls College**
**Kurunegala, Sri Lanka**


**නක්ශාස්ත්‍රය Horoscope Reading**

ඔබගේ අනාගතය, ඔබගේ දියුණුව, සෞඛ්‍ය තත්වය හා ඔබ පවුලේ දැනට හා අනාගත තත්වය සවිස්තරව දැන ගැන්මට හඳහන් ඇතිව හෝ නැතිව විමසන්න. අයකිරීම **£ 10** ක් පමණයි. ඵලාපල විස්තර අපගේ වියදමින් ක්ෂණිකව ඔබට දුරකථනයෙන් සපයන්නෙමු.

***අමතන්න - තරංගා (ජර්මණිය)***
**0049 238 2889 0683 / 0049 1515 0275 470**


## උපන්දින සුබ පැතුම් !



**දෙවන වියට පාතබන සඳලි හංසනා මොහොට්ටි ආදරණීය දියණියටද, සිව්වැනි වියට පාතබන පවිත් හංසන මොහොට්ටි අදරැති පුතාටද නිරෝගී සුවසෙත පිරුණු සුබ අනාගතයකට ලැබූ උපන්දිනයේ ආසිරි පැතුම් ගෙන එන්නේ අදරැති අම්මා, තාත්තා, ආච්චිලා හා සීයා ඇතුළු පවුලේ සියළු දෙනායි.**

## රළඟ ක්‍රීඩා ඇමති අර්ජුනද?



**ශ්‍රී** ලංකාවට ක්‍රිකට් ලෝක ශූරතා කුසලානය දිනා දුන් ලංකා හිටපු ක්‍රිකට් නායක අර්ජුණ රණතුංග මීළඟ කැබිනට් ඇමතිවරු තේරීමේදී තමා ක්‍රීඩා ඇමති වනු ඇති බවට නොබෝදා මහනුවර දී පැවති උත්සවයකදී ප්‍රකාශ කළ බව ලංකාවේ මාධ්‍යය වාර්තා කර තිබුණි.

" මේ රටේ සෑම ක්‍රීඩා අංශයකම නියැලි ක්‍රීඩකයින්ගේ හා ක්‍රීඩිකාවන්ගේ ද, ක්‍රීඩාලෝලී මහජනතාවගේ ද බලාබොරොත්තු සපුරාලන්නට නම් මා මේ රටේ ක්‍රීඩා ඇමති විය යුතුයයි මා තුළ ඉමහත් බලා පොරොත්තුවක් දැල්වුණා. ඒ අනුව මම ඒ කරා යමින්, ක්‍රීඩාව තුළින් අප ශ්‍රීලංකාව ලෝකයේ බබලවන්නට අධිෂ්ඨාන කරගත්තා " අර්ජුණ රණතුංග මහතා පවසා ඇත. ඔහු මෑත කාලයේ ක්‍රීඩා ඇමතිවරුන් ටද පහරක් ගැසීය.

" මට දේශපාලනයට එන්න කැමැත්තක් තිබුණෙ නෑ මම දේශපාලනයට ඇතුල්වුණේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් යමක් කරන්න. එස්. බී. දිසානායක හිටපු ක්‍රීඩා ඇමතිවරයාට පස්සෙ කිසි කෙනෙක් ක්‍රීඩාවේ දියුණුවට වැඩක් කරලා නැහැ. ඒක මහ ඛේදවාචකයක්."

" ක්‍රීඩා අංශය අද ඉතා පහළට වැටිලා. මම තරුණ ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගෙන් ඉල්ලන්නෙ ක්‍රීඩාවේ තමන්ට අතපොත් තැබූ ගුරුවරුන් අමතක කරන්න එපා. විදේශීය පුහුණුකරුවන් පස්සෙ සමහරු දුවනවා. විදේශීය අයට වඩා ගමේ හිටි පුහුණුකරුවන් තමයි අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුලින්ම අත දුන්නේ. නමුත් අපේ සමහර අය මේ බව අමතක කිරීම කණගාටුවට කාරණයක්. "